# මනඃකල්පිත කුරුල්ලෝ

සැකසුම - අරුණ පද්මපෙරුම, සාන්ත උදය කුමාර

දෙනෙතින් දකින දේ මෙන්ම සිතින් මවාගත් දේවල්ද සෑම ජන සමාජයකම පවතී. සත්ත්ව රටාසම, ශාක රටාසම, මල් වර්ග, දේවරූප යනාදිය සිතින් මවාගත් වස්තූන් අතර ප්‍රමුඛය. ගොඩබිම පරිසරයේ පමණක් නොව ජලාශ්‍රිත පරිසරයේද අංග යොදා ගනිමින් අපූර්ව ජීවීන් නිමවා තිබේ. මනඃකල්පිත රූප ලෙස මේවා මිනිසුන් අතර ජනප්‍රියය.

පැරණි මිනිසා තුල සොබාදහම කෙරෙහි තිබූ කුතුහලය සහ එයට ආරෝපණය කරන ලද ගුප්ත බව ඇතැම් සතුන් සඳහා වෙසෙස් ස්ථානයක් ලබා දීමට හේතු වූ බව සිතිය හැකිය. සැබෑ ලෝකයේ දැකිය හැකි වස්තූන් සංකලනය කිරීමෙන් මනඃකල්පිත ජීවීන් ගොඩනැගුහ. සෑම මනඃකල්පිත ජීවියෙක් පාහේම ප්‍රමාණයෙන් විශාල බව හැඟවීම කරති. ගුරුළා, මකරා, අනන්ත නාගරාජයා වැනි ජීවීන් නිදසුන් ලෙස ගත හැකිය. ඒ ඒ සතුන්ගේ සැබෑ ජීවිතයට සාපේක්ෂව ඔවුනගේ දිග පළල ගැන සිතා ගැනීමටත් අපහසුය. එසේම මෙම ජීවීන් වෙත නතුව පවතින අයෝමය ශක්තිය ගැනද පුන පුනා හොවා දක්වයි. යම් ක්‍රියාවක් මිනිසුන්ට නුපුලුවන් වන අවස්ථාවක එම දුෂ්කර වූ කොටස ඉටු කිරීමට හැකි විශ්ව කර්මයන් හැටියට මනඃකල්පිත ජීවීන් නිරූපනය කර ඇත.

මනඃකල්පිත ජීවීන් අතර කුරුලු රටාසම කිහිපයක් ද සිටිති. සමාජ, සංස්කෘතික, ආගමික සහ සාහිත්‍යමය සිද්ධීන් වලදී මෙම ජීවීන් පිළිබඳව නිතර කතාබහට ලක් කෙරේ. ගැමියන් එදිනෙදා භාවිතා කරන උපකරණ වල, විහාර ගෙයක සිතුවම් අතර, පුරාවිද්‍යාත්මක පත-පොත තුළ, සාහිත්‍යයේ කතාන්දර සමග මෙම අපූරු කුරුල්ලන් ගැන කියැවෙන ප්‍රබන්ධ අපමණය. හේරුණ්ඩ පක්ෂියා, ඇත්කඳ ළිහිණියා, ගුරුළා, මෝස්තර මොණරා වැනි සතුන් මනඃකල්පිත නිර්මාණ අතර ප්‍රචලිතය. මෙයින් කිහිපයක් ගැන විමසා බලමු.

### හේරුණ්ඩ පක්ෂියා

පාසල් චිත්‍ර කලා විෂයට සම්බන්ධ පක්ෂියෙකි. සාම්ප්‍රදායික පොත-පත තුළ නිරූපිතය. මෙම පක්ෂියාගේ ස්වරූපය ඉතිහාස කතන්දර වල සඳහන්ව ඇත්තේ මෙසේය.

ගෙලෙන් නැමී, දෙපසට ගිය ඔලු (හිස්) දෙකක්ද විහිදාගත් පියාපත් සහ තියුණු නිය සහිත පා යුගලක් ද ඇති පක්ෂියෙකි.

ජනප්‍රවාද වලට අනුව මේ සතාගේ ආරම්භය සීතාවක අවධිය තෙක් දිවයයි. සීතාවක රාජසිංහ රජුගේ සත්ත්ව එකතුවේ සිටි කුරුල්ලෙකු ඇසුරෙන් නිර්මාණය වූ ජීවියෙකු බවද පවසන අවස්ථා තිබේ. එහෙත් මේ සතාගේ උප්පත්ති කතාන්දරය සැකසී ඇත්තේ මතු දැක්වෙන අයුරිනි.

රාජසිංහ රජතුමා සතුන් කෙරෙහි ඇල්ම හා කරුණාව දැක්වූවෙකි. එනිසා රටවැසියන් මහාවාසලට ඉතා දුර්ලභ සතුන් ලබාදීමෙන් තෑගි-බෝග ලබා ගැනීමට පුරුදු වූවෝය. දිනක් ගම් වැසියන් කිහිපදෙනෙකු වනාන්තරයේ ඇවිද ගියෝය. ඔවුනට ගුහාවක විසූ අමුතුම ආකාරයේ කුරුල්ලෙකු දැක ගැනීමට ලැබුණි. දිගින් දිගටම එම කුරුල්ලා ගැන ඔවුන් විමසිලිමත් වූවෝය. එක් අවස්ථාවක කුරුල්ලා ජීවත්වන ගුහාව පරීක්ෂා කළහ. එවිට ඔවුන්



අතට පත් වූයේ පෙරකී කුරුල්ලාගේ පැටියෙකි. ඔවුහු වහා කුරුලු පැටියාව වාසලට භාර දුන් අතර විශාල තෑගි බෝග ප්‍රමාණයක් ද එයින් ලබා ගත්හ.

රජතුමාද මෙම කුරුල්ලාට විශේෂ සැලකිල්ලක් දැක්වූහ. කලක් යන විට රජතුමා සමග දඩයමේ යාමටද මේ කුරුල්ලා පුරුදු විය. දිනක් වේගයෙන් දිවයන මුවෙකු පිටුපස පියාඹාගිය කුරුල්ලා මුවාගේ හිසට තම නිය වලින් පහර දුන්නේය. මුවා, කුරුල්ලාද හිසෙහි රදවාගෙන වේගයෙන් දිවීය. මුවා නතර කර ගැනීමට සිතූ මෙම කුරුල්ලා එක් පයකින් මුවාගේ හිස අල්ලා ගෙන අනෙක් පයින් ගසක් තරයේ අල්ලා ගත්තේය. මුවාගේ වේගවත් දිවීම නිසා සිදුවූයේ ඛේදජනක සිදුවීමකි. කුරුල්ලා දෙපලු විය. මෙය දුටු රජතුමාට මහත් දුකක් ඇති වුනි. රජතුමා වහාම චිත්‍ර ශිල්පීන් කැඳවා වියෝවූ තම සුරතලාගේ රුව සිතුවමට නැගීමට කටයුතු කලේය. එසේ සිතුවමට නගන ලද්දේ දෙපලු වූ කුරුලු සිරුරයි. එදා පටන් අද දක්වාම හිස් දෙකක් සහිත කුරුලු රුව සිත්තරුන් අතින් හැඩ-වැඩ වෙමින් පැවත ගෙන එයි.

හේරුණ්ඩ පක්ෂියා නුවර යුගයේ බෙහෙවින් ප්‍රචලිත කලා කෘතියකි. සිතුවමට වඩා කැටයමට යොදාගෙන ඇත. ඇම්බැක්කේ දේවාලයේ කැටයම් අතර දක්නට ලැබේ. සිංහලයේ දිසා කොඩි අතර තුන් කෝරලයේ කොඩියේ ලාංජනය ලෙස යොදාගෙන ඇත්තේද හේරුණ්ඩ පක්ෂියායි. එපමණක් නොව ජන්ම පත්‍රයේ හෙවත් කේන්දරයේද මෙම පක්ෂියා පිළිබඳ සඳහන් වේ. කෙන්දරයේ සඳහන් චතුර්විධ පක්ෂීන් අතරින් හේරුණ්ඩ පක්ෂියාද එකකි.



## ඇත්කඳ ලිහිණියා

නමින් ඇත්කඳ වුවත් තිබෙන්නේ ඇත් හිසකි. විශාල කඳකි. විහිදාගත් පියාපත් තිබේ. විශාල දෙපයක් හිමිය. දිගු නිය සහිත පා දෙකකි. ඇතුන් දෙදෙනෙකු රැගෙන පියාඹන අයුරින් නිර්මාණය කර තිබේ. මෙම කුරුල්ලා ඇතුන්ට මරණය නොහොත් භීතිය ගෙන දෙන්නෙකු බව ජනප්‍රවාදයේ පැවතේ. මේ රුවද කැටයම් සඳහා යොදාගෙන තිබේ. ඇම්බැක්කේ දේවාලයේ කැටයම් අතර දක්නට හැකිය. මෙම පක්ෂියා හා සබැඳි විවිධ ජනප්‍රවාද ඇති අතර ඉන් එකක සඳහන් වන්නේ උනුන් හා සටන් කර මිය ගිය ඇතුන් හා කඟවේණුන් ගොදුරු කර ගන්නා පක්ෂියෙකු බවයි. ඇතුන් ඩැහැගෙන යන විලාසයෙන් නිර්මාණය කර ඇත. එසේම අලි ඇතුන් මෙල්ලකර ගැනීමට යොදා ගන්නා අංකුසය හෙවත් හෙණ්ඩුවේ වක් වූ උල තනා ඇත්තේද ඇත්කඳ ලිහිණියාගේ නිය වල ආකාරයට බව පැවසේ. මෙයින් පැවසෙන්නේ ඇතුන් හා ලිහිණියා අතර සම්බන්ධතාවයයි.

## ගුරුළා

ගුරුළා යන නමින් හඳුන්වන්නේ උකුස්සෙකු වැනි පක්ෂියෙකි. ඇතමෙක් ගුරුළා කැටයමට නඟා ඇත්තේ සරපෙන්දාගේ රූපයෙන් බව පවසති. එයින් කිවෙන්නේ ගුරුළා හා සරපෙන්දා එකම සතෙකු බවයි. ඒ කෙසේ වෙතත් පැරණි සාහිත්‍යයේ සහ ජනප්‍රවාද වල ගුරුළා පිළිබඳ බොහෝ තොරතුරු සඳහන් වේ.

දේව කතා වලට අනුව විෂ්ණු දෙවියාගේ වාහනය වන්නේ ගුරුළාය. මොහුගේ ප්‍රධාන ආහාරය වන්නේ නාගයින්ය. එනිසා විෂ්ණු දෙවියන්ගේ සයනය වූ අනන්ත නා රජු හා වාහනය වූ ගුරුළා අතර ඇත්තේ සදාතනික වෛරයි. ජන විශ්වාස වලට අනුව ගුරුළා වාසය කරන්නේ ඉඹුල් විමනකය. විමන යනු වනාන්තරයයි. සිංහල නර්තන කලාවටද ගුරුළා විශේෂ සතෙකි. ගුරුළු කෝලම, ගුරුළු රාක්ෂ නැටුම ආදී නර්නත අංග කිහිපයක්ම තිබෙන බැවිනි. වෙස් මුහුණු කලාවේ මෙම පක්ෂියා සඳහා විශේෂ වෙස් මුහුණක් තිබේ. එය ගුරුළු රාක්ෂ මුහුණයි.

## කිඳුරා

දිය කිඳුරු, ළිය කිඳුරු, සඳ කිඳුරු ආදී වර්ග කිහිපයක කිඳුරන් ගැන සඳහන් වේ. මේ කවරෙකුගේ වුවද ඉනෙන් උඩ මිනිස් කයකි. ඉනෙන් පහළ විවිධත්වයක් ගනී. එහෙත් ජනප්‍රවාදයේ අපට හමුවන පක්ෂි කිඳුරු රුව මේ සියල්ලටම වඩා වෙනස්ය.

පක්ෂියෙකු මෙන් පියාපත් සහිතව ඉනෙන් පහළ කොටස පෙඳයකින්ද යුත් රූපය පක්ෂි කිඳුරාගේ රුවයි. මොවුන් ගී ගායනයටත් වාදනයටත් සමත්කම් දක්වන බව කියවේ.

## සරපෙන්දා

සතුන් තිදනෙකුගේ කොටස් එකතු වීමෙන් නිර්මාණය වූ රුවකි. සිංහ මුහුණක් ද මත්ස්‍ය කොරපොතුද සහිත හංස කඳකින් ද යුක්තය. අලංකාර පිල් කළඹක් ද තිබේ. කැටයම් සඳහා බහුලව භාවිතා කළ රූපයකි. එක් පයක් ඔසවාගෙන සිටින අතර මුවෙහි මල් කිනිත්තක් හෝ ගිනිදැල්ලක් සහිතය. මඟුල් මඩුවේ සහ ඇම්බැක්කේ දේවාලයේ දක්නට ලැබේ.

ලංකාව, ඉන්දියාව, චීනය වැනි රටවල මනඃකල්පිත රූප බොහොමයක් පවතී. ඉතිහාසයේ එක් ඓතිහාසික යුගයකදී මේවා කරලියට විත් තිබේ. ම්ලෙච්චත්වයෙන් මිදී ශිෂ්ඨ සමාජයක් වෙත යන ගමනේ මෙම මනඃකල්පිත නිර්මාණද කිසියම් සමාජ මෙහෙවරක් සිදු කළ බව නොරහසකි. එහෙත් වර්තමාණයේ දී මේවා කලාත්මක නිර්මාණ වලට පමණක් සීමා වී තිබේ.

## Mythical Birds

Our ancestors were curious about nature. They combined the real world with mythical concepts and created mysterious supernatural animals. All these are larger in size and most of them possess some sort of superpowers. There are few birds mentioned in Sri Lanka's social, cultural, and religious proceedings. Stories relating to these mythical birds are found in ancient literature and illustrated in temple paintings. Berunda pakshiya, Athkanda lihiniya, kindura, are some of these mythical birds.